බැංකු පනත් විධාන 2018 අංක 01 2018 පෙබරවාරි 08

## මෝටර් රථ සම්බන්ධ ණය පහසුකම් සඳහා වටිනාකම මත ණය අනුපාතය

**1988 අක 30 දරන සංශෝධිත බැංකු පනතේ 46(1) සහ 76(ඒ)(1) යන වගන්ති ප්‍රකාරව නිකුත් කරන ලදී.**

මෝටර් රථ මිලදී ගැනීම හෝ භාවිතය සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු මගින් ලබා දෙන ණය පහසුකම් සම්බන්ධයෙන්, වටිනාකම් මත ණය අනුපාත (LTV) ක්‍රියාවට නැංවීම උදෙසා, මුදල් මණ්ඩලය විසින් පහත සඳහන් විධානයන් නිකුත් කරන ලදී.

1. බැංකු පනත යටතේ බලගැන්වීම

1.1 මුදල් නීති පනතේ 46(1) සහ 76(ඒ)(1) වන වගන්ති ප්‍රකාරව බැංකු පද්ධතියේ ශක්තිමත්භාවය සහතික කිරීම සඳහා, සියලුම හෝ යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වෙත එම බැංකු ව්‍යාපාරයේ කිසියම් ව්‍යාපාර කටයුත්තක් පවත්වාගෙන යාම පිළිබඳ විධානයන් නිකුත් කිරීමට මුදල් මණ්ඩලය වෙත බලය පැවරී ඇත.

2. උපරිම වටිනාකම් මත ණය අනුපාතය

2.1 2018 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සියලුම බලපත්‍රලාභී බැංකු විසින් මෝටර් රථ මිලදී ගැනීම හෝ භාවිතය සඳහා ලබා දෙන ණය පහසුකම්, එම වාහනවල වෙළඳපොළ වටිනාකම මත පහත සඳහන් අනුපාතයන් නොඉක්මවිය යුතුය.

(i) ලියාපදිංචි නොකළ වාහන සහ මෙරට තුළ ප්‍රථම ලියාපදිංචියෙන් පසු වසරකට නොවැඩි වාහන සඳහා

**වගුව 1 - වටිනාකම මත ණය අනුපාතය**

| වාහන කාණ්ඩය | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වර්ගීකරණය | විද්‍යුත් මෝටර් රථ | වෙනත් |
|---|---|---|---|
| ව්‍යාපාරික වාහන | C1, C, CE, D1, D, DE, G1,G, J | 90% | 90% |
| මෝටර් කාර්, ක්‍රීඩා උපයෝගීතා වාහන (SUVs) සහ වෑන් රථ | B (සැහැල්ලු ට්‍රක් රථ සහ ඒකල කැබ් රථ - single cabs හැර) | 90% | 50% |
| ත්‍රීරෝද රථ | B1 | 90% | 25% |
| අනෙකුත් වාහන | A1, A සහ B කාණ්ඩය යටතේ වර්ගීකරණය කළ සැහැල්ලු ට්‍රක් රථ සහ ඒකල කැබ් රථ - single cabs | 90% | 70% |
| දෙමුහුම් මෝටර් කාර්, ක්‍රීඩා උපයෝගීතා වාහන (SUVs) සහ වෑන් රථ | B (සැහැල්ලු ට්‍රක් රථ සහ ඒකල කැබ් රථ - single cabs හැර) | 70% | |

(ii) ප්‍රථම ලියාපදිංචියෙන් අනතුරුව ශ්‍රී ලංකාව තුළ වසරකට වඩා වැඩි කාලයක් භාවිත කරන ලද සියලුම වාහන සඳහා 70%

| | | | |
|---|---|---|---|
| 3. | උපරිම වටිනාකම් මත ණය අනුපාතයන් වෙතින් නිදහස් කිරීම | 3.1 | ඉහත විධාන අංක 2 හි සඳහන් ණය සීමාවන්, සංචාරක ක්ෂේත්‍රයේ හෝ ප්‍රවාහන/ගමනාගමන ක්ෂේත්‍රයේ ප්‍රධාන ව්‍යාපාරික කටයුතු (core business) උදෙසා යොදා ගැනීම පිණිස මෝටර් රථ සමූහ (vehicle fleet) මිලදී ගැනීම සඳහා ණය පහසුකම් ලබා ගැනීමේදී අදාළ නොවන අතර, එසේ මිලදී ගන්නා මෝටර් රථ ප්‍රථම ලියාපදිංචියේ සිට වසරක් ගතවීමට පෙර වෙනත් පුද්ගලයෙකුට හෝ ආයතනයක් වෙත පැවරිය නොහැකි වේ. |
| | | 3.2 | බලපත්‍රලාභී බැංකු විසින් මෙම වාහන කාණ්ඩ සඳහා ණය පහසුකම් ලබා දීමේදී අභ්‍යන්තර සීමාවන් පවත්වා ගත යුතු අතර ප්‍රමාණවත් පරිදි අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ගයන් යොදා ගත යුතුය. |
| 4. | මෝටර් රථ සඳහා වන අනෙකුත් ණය පහසුකම් | 4.1 | ඉහත සඳහන් විධාන අංක 2 සහ 3 යටතේ ඇති ණය පහසුකම්වලට අමතරව මෝටර් රථ මිලදී ගැනීම හෝ භාවිතය සඳහා බලපත්‍රලාභී බැංකු විසින් වෙනත් ණය පහසුකම් ලබා නොදිය යුතුය. |
| 5. | අර්ථ දැක්වීම | 5.1 | ණය පහසුකම් යනුවෙන් අදහස් වන්නේ අවසාන පාරිභෝගිකයින් සඳහා මෝටර් රථ මිලදී ගැනීම හෝ භාවිතය සඳහා ලබා දෙනු ලබන, මූල්‍ය කල් බදු, කුළී පිට ගැණුම් සහ අනෙක් සියලුම ණය පහසුකම් ය. |
| | | 5.2 | මෝටර් රථයේ වටිනාකම වෙළඳපොළ වටිනාකම විය යුතුය. බලපත්‍රලාභී බැංකු විසින් මෝටර් රථ වටිනාකම තක්සේරු කිරීම පහත පරිදි සිදු කළ හැකිය.<br>(i) නවතම මෝටර් රථ - බලයලත් නියෝජිතයන් විසින් ලබා දෙනු ලබන තක්සේරු අගය<br>(ii) අලුත්වැඩියා කර සැකසූ මෝටර් රථ - රේගු වටිනාකම හෝ නියෝජිතයන් විසින් ලබා දෙන ලද ඉන්වොයිසියේ වටිනාකම<br>(iii) ලියාපදිංචි කරන ලද මෝටර් රථ - වෘත්තීමය තක්සේරුකරුවකු විසින් ලබා දුන් වටිනාකම |
| | | 5.3 | ණය පහසුකම් ලබා දෙන අවස්ථාවේදී තක්සේරුව ලබා ගත යුතු අතර එය නිවැරදි සහ සාධාරණ අගයක් බවට බලපත්‍රලාභී බැංකු තහවුරු කරගත යුතුය. |
| | | 5.4 | විධාන 3.1 හි වාහන සමූහයක් (fleet of vehicles) යන්නෙන් අදහස් වන්නේ වාහන දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවකි. |
| | | 5.5 | විධාන 3.1 හි සංචාරක ව්‍යාපාරයේ යෙදෙන ආයතනයක් යන්නෙන් අදහස් කෙරෙන්නේ, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ හෝ වෙනත් අධිකාරියක සංචාරක කර්මාන්තය හා අදාළ සේවාවන් ලබා දීම සඳහා ලියාපදිංචි වී ඇති සංචාරක සේවා සපයන ආයතනයක් වේ. |
| | | 5.6 | විධාන 3.1 හි ප්‍රවාහන ක්ෂේත්‍රයට සම්බන්ධ ආයතනයක් යන්නෙන් අහස් කෙරෙන්නේ, භාණ්ඩ හෝ මගී ප්‍රවාහන සේවාවන් සඳහා රජයේ අධිකාරියක ලියාපදිංචි වූ ඕනෑම ව්‍යාපාරික ආයතනයක් වේ. |
| 6. | පෙර පැවති විධානයන් අහෝසි කිරීම | 6.1 | පහත සඳහන් විධානයන් මෙයින් අහෝසි කෙරේ.<br>(i) බැංකු පනත යටතේ නිකුත් කරන ලද, 2017 විධාන අංක 01 දරන මෝටර් රථ වාහන සම්බන්ධයෙන් වන ණය පහසුකම් සඳහා වන වටිනාකම් මත ණය අනුපාතය<br>(ii) බැංකු පනත යටතේ නිකුත් කරන ලද, 2017 විධාන අංක 02 සහ 04 දරන මෝටර් රථ වාහන සම්බන්ධයෙන් වන ණය පහසුකම් සඳහා වටිනාකම් මත ණය අනුපාතය පිළිබඳ සංශෝධිත විධානයන් |

අත්සන් කළේ,
ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
**මුදල් මණ්ඩලයේ සභාපති සහ**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති**